# තෙවන තේමාව - දේව පණත් පිළිපදිමින් නීතිගරුක හා සදාචාර සම්පන්න ජීවිතය


20

## 3.4. පොදු දේපල ආරක්ෂා කරමු.

දෙවියන් වහන්සේ ඔවුන්ට ආසිරි පතමින් "නුඹලා දරු සම්පත් ලබා, වැඩි වර්ධනය වී, පොළොව පුරා පැතිර එය යටත් කරගන්න. මුහුදේ මසුන් කෙරෙහි ද අහසේ පක්ෂීන් කෙරෙහි ද පොළොවේ සැරි සරන සියලු සතුන් කෙරෙහි ද බලය පවත්වන්නැ'යි ඔවුන්ට වදාළ සේක.

(උත්පත්ති 1:28)

දෙවියන් වහන්සේ මිනිසා මවා මේ ලෝකය ඔහුට භාරදුන් සේක. එය වර්ධනය කර ආරක්ෂා කර තමාටත් අනාගත පරපුරටත් එය රැගෙන යාම මිනිසාගේ උතුම් වගකීම වෙයි.



**පිළිතුරු ලියන්න.**

- ස්වභාව ධර්මය පිළිබඳ ඔබගේ වගකීම කුමක් ද?
- මැවිල්ල ඔබට කෙලෙස ආරක්ෂා කළ හැකි ද?
- අපි මැවිල්ලට එරෙහි ව ක්‍රියාකාරී වීමෙන් ඇති වන බලපෑම් මොනවා ද?

මනුෂ්‍යයා සමාජයේ ජීවත් වුව ද ඔහුට පෞද්ගලිකත්වයක් ඇති බව අමතක නො කළ යුතු ය. ඒ නිසා ඔහුට යම් යම් දේ පෞද්ගලික ව තමන් සතු කර ගැනීමේ අයිතියක් ඇත්තේ ය.

තමාගේ ද තම පවුලේ සාමාජිකයන්ගේ ද අවශ්‍යතා පිරිමසා ගැනීමට සෑහෙන තරම්වත් වස්තුව, යටත් පිරිසයෙන්, කෙනකුට අයිති ව තිබිය යුතු ය. එසේ නොමැති වූ විට උතුම් මානව නිදහස අනෙකකුට පවරා දීමට සිදු වේ. එසේ ම පුද්ගලයා තුළ ඇති කුසලතා සහ දක්ෂතා අනුව ඉදිරිපත් කළ හැකි ස්වයං නිර්මාණාත්මක කාර්යයන් සඳහා ද බාධා ඇති වේ.

දෙයාකාර තරාදි ද දෙයාකාර කලන් පඩි ද ඇත. ඒවා සමිඳුන් හට පිළිකුලකි.

(හිතෝපදේශය 20:10)

**සොරකම් නො කරන්න.**
**හත්වන දේව පණතයි.**

නුඹේ අසල් වැසියාගේ භාර්යාවට ඇලුම් නො කරන්න. නුඹේ අසල් වැසියාගේ ගෘහයට හෝ කෙතට හෝ ඔහුගේ සේවක සේවිකාවන්ට හෝ ඔහුගේ ගවයාට හෝ කොටළුවාට හෝ අසල් වැසියා සතු කිසිවකට හෝ තණ්හා නො කරන්න.

(ද්විතිය නීති සංග්‍රහය 5:21)

- ඉහතින් දැක්වෙන බයිබල් පාඨ කුමන පනත්වලට අදාළ වේද?

අප වස්තුව ලබාගත යුත්තේ සාධාරණව ය.

- අවංකව වැඩ කිරීමෙන්
- මිලයට ගැනීමෙන්
- හුවමාරුවෙන්
- තෑගි වශයෙන් සහ
- උරුම වශයෙනි.

අන් කුමන ආකාරයකින් හෝ වස්තුව ලබාගැනීම නැතහොත් ඊට කැමැති වීම සමාජ විරෝධී බරපතල වරදකි.

පවුලේ සමඟියත්, ආත්ම ගෞරවයත්, චරිත පාරිශුද්ධියත්, පමණක් නොව උදාර ජාතික සංස්කෘතික උරුමයනුත්, අපේ සාරධර්මයන් විනාශ කරමින් තරගකාරී සමාජයක වස්තුව ඉපයීමට වහල් වී සිටින මනුෂ්‍යයාට ජේසුස් වහන්සේගේ අවවාද මෙසේ ය.

> මෙලොව ඔබට වස්තු රැස්කර නො ගන්න. මලකඩ ද කාවෝ ද ඒවා කා දමති. සොරු ද උමං කැණ ඒවා සොරා ගනිති. එහෙත් ස්වර්ගයෙහි ඔබට වස්තු රැස්කර ගන්න. . . . . . ඔබගේ වස්තුව කොතැනක ද ඔබගේ සිතත් එතන ය.
>
> (මතෙව් 6:1921)

ඕනෑ ම වස්තුවක් පෞද්ගලික ව අප සතු ව පවත්නා අතර ම එය දෙවියන් වහන්සේට අයත් වන්නේ ය. අපි උන්වහන්සේගේ භාණ්ඩාගාරිකයෝ ද එම වස්තුවෙහි ආරක්ෂකයෝ ද පමණක් වෙමු. එම නිසා දේව අභිප්‍රායට එකඟ ව වස්තුව පරිහරණය කළ යුත්තෙමු. පෞද්ගලික වස්තුව අප වියදම් කළ යුත්තේ යුක්ති ගරුකව ය. එසේ ම අසල්වැසියන්ගේ අවශ්‍යතාවන්ට ද දේව රාජ්‍යයේ කාර්යයන් සඳහා ද පරිත්‍යාගී වීම ද අපගෙන් අනිවාර්යයෙන් ම සිද්ධ විය යුතු ය.

ලෞකික වස්තුව සියල්ල ම මිනිස් වර්ගයා සඳහා වියදම් කිරීම දේව අභිමතය වෙයි. සෑම පෞද්ගලික වස්තුවකට ම අපි තනි තනි ව දෙවියන් වහන්සේට යම් දවසක වගකිව යුතු බව සිහි තබා ගත යුතු ය.

ඇතැම් විට සමාජයේ එක් පුද්ගලයකුට අන් අයට වඩා බෙහෙවින් ම වැඩි සම්පත් ප්‍රමාණයක් තිබෙන්නට පුළුවන. ඒවා ඔහුට ලැබී ඇත්තේ ඔහුගේ වාසනා මහිමය නිසාවත් මහන්තත්වය නිසාවත් නොවේ. දේව අභිමතය වන්නේ ඔහු මඟින් එම සම්පත් අවශ්‍ය අය අතර බෙදා ගැනීම ය. එසේ නො සිතන ධනවතුනට සිදු වන දේ ධනවතා හා ලාසරස් පිළිබඳ කථාන්තරයෙන් පැහැදිලි වෙයි.

**(ලූක් 16:1931)**

- කිතුනුවා ස්වකීය වස්තුවට මෙන් අය අයගේ වස්තුවට ගරු කළ යුතු යි. සුරැකිය යුතු යි. ඊට විරුද්ධ ව සිතිවිල්ලක් පවා ඇති කර ගැනීම වරදකි.
- අනුන්ගේ වස්තුව පාලනය කිරීමට හෝ ආරක්ෂා කිරීමට හෝ පරිහරණය කිරීමට හෝ යමකුට සිදුවුවහොත් ඉතා සුපරීක්ෂාකාරී ව එය කළ යුතු යි.

**පිළිතුරු සපයන්න.**

1. ඔබට සාධාරණ ව වස්තුව ලබාගත හැකි මාර්ග කවරේ ද?
2. ඔබට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි වස්තුව තිබේ නම් ඔබ එයට කුමක් කරන්නෙහි ද?
3. ඔබට වස්තුව ලැබී තිබෙන්නේ කුමක් සඳහා ද?

ණය ලබාගන්නා යථා පරිදි එය ගෙවිය යුතු ය. හාම්පුතා සේවකයන්ට නියමිත වේතනය ගෙවිය යුතු ය. අයථා ක්‍රමවලින් අනුන් රවටා මුදල් රැස්කිරීම මහත් වරදකි. පාරිභෝගික ද්‍රව්‍ය වංචාකාරී ලෙස සකස් කර අලෙවි කිරීම ද මෙතෙක් අප සාකච්ඡා කළ හත් වැනි හා දස වැනි පණතවලට පමණක් නොව පස්වැනි පණතට ද විරුද්ධ ක්‍රියාවන් ය.

> නුඹට ඇති දෙයින් දෙන දානය මැනිය යුතු ය. වැඩියෙන් තිබේ නම් වැඩියෙන් දෙන්න. අඩුවෙන් තිබේ නම්, අඩුවෙන් දෙන්න. එහෙත් දන්දීමේ දී මසුරු නොවන්න.
>
> (තෝබිත් 4:8)

මිල මුදල් හා වස්තුව සපයා ගැනීම කිසි විටෙක අපගේ ජීවිතයේ ප්‍රමුඛ අපේක්ෂාව නො විය යුතු යි. කෑදරකමට ලෝභයට හා මසුරුකමට විරුද්ධ ව අප සුපරික්ෂාකාරී වීම ඉතා වැදගත් ය.

ප්‍රමාණයට වඩා මිල මුදල් ඉපැයීම නොකළ යුතු යි. එසේ වුවහොත් ඔබට මෙලොව යහපත් ජීවිතයක් ගත කිරීමට නො හැකිවනු ඇත. මන්ද,

- අධික වෙහෙසීම නිසා ලෙඩ රෝග වැළඳේ.
- අනිසි මිතුරුන් ඇති වේ.
- අනවශ්‍ය වියදම් ඇති වේ.
- උවමනාවල සීමාවක් නැති වේ.
- ආගම ධර්මය ඇදහීමට වෙලාව නොමැති වේ.
- පවුලේ සබඳතා අඩුවේ.
- සියල්ල සම්පූර්ණ යැයි සිතයි.

මුදලට ආශා නොවී සිටින්න.
ඇති දෙයින් තෘප්තිමත් වන්න.

(හෙබ්‍රෙව් 13:5)

පෞද්ගලික හා පොදු දේපල ආරක්ෂා කිරීම අපේ වගකීම වෙයි. පොදු දේපල මුළු රටෙහි ම ජනතාවට අයිති ඒවා වෙයි. එය විනාශ කිරීම වැරදි සහගත ක්‍රියාවකි. එසේ ම එය අනාගත පරම්පරාවට නැති කිරීමකි. වැඩ වර්ජන ක්‍රියාවන්හි නිරත වී පොදු දේපල ගිනි තබා විනාශ කිරීම අද ලොකයේ දක්නට පුළුවන. මෙ වැනි ක්‍රියා නිසා රටේ ආර්ථිකය පහත වැටී රටේ දියුණුවට බාධා ඇති වේ.

සෑම ආර්ථික ක්‍රියාවක් ම සමාජයේ යහපත පතා කළ යුතුයි. ජාති, කුල, ආගම් භේද නොතකා සෑම කෙනකුගේ ම දියුණුව පතා ක්‍රියාකිරීම වැදගත් වෙයි.

ලෞකික සම්පත් ඇති කෙනෙක්, තම සහෝදරයාගේ හිගකම, දැක දැකත් ඔහුට අනුකම්පා නො කරන්නේ නම් දෙවියන් වහන්සේගේ ප්‍රේමය ඔහු තුළ පවතින්නේ කෙසේ ද?

(1 ජොහන් 3:17)

අන් වස්තු ආශා නොකරන්න.
දහවන දේව පණතයි.

**පිළිතුරු ලියන්න.**

- ඉහත බයිබල් පාඨවලින් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ මොනවා ද?
- 7 හා 10 පණත්වලට විරුද්ධ ව ඔබ නො කළ යුතු දේවල් දහයක් ලියන්න.

**ඔබේ මතකය සඳහා...**

- ❒ අනුන්ගේ දේ සොරකම් නො කිරීම.
- ❒ වස්තුව නාස්ති නො කරන අරපිරිමැස්මෙන් පරිහරණය කිරීම.
- ❒ ලැබෙන දේ ගැන දෙවිඳුන් පැසසීම.
- ❒ අන් අයගේ අගහිඟවල දී උදව් කිරීම.
- ❒ වංචා සහගත ව වස්තුව රැස් නො කිරීම.
- ❒ අනුන්ගේ වස්තුවට ඊර්ෂ්‍යා නො කිරීම.
- ❒ සියලු ම වස්තුවල හිමිකරුවාණන් දෙවියන් වහන්සේ බව සැලකීම.



පෞද්ගලික හා පොදු දේපල ආරක්ෂා කිරීම අපේ වගකීම වෙයි.